## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 242

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලය

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද
වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 120(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ
හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

## பாராளுமன்ற வெளியீட்டு தொடர் இலக்கம் - 242

ஸ்ரீ ஜயவர்தனபுர பொது வைத்தியசாலை சபை

பாராளுமன்ற பொது முயற்சிகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 120(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

## Parliamentary Series Number – 242

**Sri Jayawardanepura General Hospital Board**

Submission of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Enterprises in terms of Standing Order No. 120(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - **242**

ආයතනය - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල මණ්ඩලය

| කාරක සභා නියෝගය/නිර්දේශය | | නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 01. | දැක්ම සහ මෙහෙවර | ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහල මණ්ඩලයේ අනුමැතියලත් වර්තමාන දැක්ම සහ මෙහෙවර පහත පරිදි වේ.<br>**දැක්ම,**<br>"ශ්‍රී ලංකාවේ හොඳම සෞඛ්‍ය සත්කාර සපයන්නා බවට පත්වීම "<br>"To be the best healthcare provider in Sri Lanka."<br><br>**මෙහෙවර,**<br>"නවීනතම තාක්ෂණය භාවිතා කරන දක්ෂ කාර්ය මණ්ඩලයක් සමගින් අචාරධර්මානුකූල මිත්‍රශීලි හා සානුකම්පිත වටපිටාවකින් යුතුව ජාත්‍යන්තර සම්මතයන් හා සමවනසේ නිපුණතාව වැඩිදියුණු කිරීම සහ දැරිය හැකි පරිපූර්ණ ඉහල ගුණාත්මකභාවයෙන් යුත් ආරක්ෂිත සෞඛ්‍ය සත්කාර සැපයීම"<br>"Provide affordable, comprehensive, high quality, safe healthcare and develop competency in par with international standards in an ethical, friendly and compassionate atmosphere with the use of state of the art technology by a competent work force" |
| 02. | සංයුක්ත සැලැස්ම | දැනට පිළියෙළ කර ඇති සංයුක්ත සැලැස්ම, දේශපාලනික හා ප්‍රතිපත්තිමය වෙනස්කම්වලට අනුරූප වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාලෝචනය කර ඊට අනුගතව සකස් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්මද සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| 03. | ක්‍රියාකාරී සැලැස්ම | 3.1 හා 3.2 කරුණට අදාලව පරීක්ෂා කිරීම සඳහා අංක MH/FS/PI/15/2025/A-175/341 යටතේ හා 3.3 හා 3.4 කරුණට අදාලව අංක MH/FS/PI/08/2025/A-164/319 යටතේ මූලික පරීක්ෂණයක් ක්‍රියාත්මක වේ.<br><br>මේ වන විට සූර්ය කෝෂ පද්ධති සවි කිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර 2026 මාර්තු මස වන විට මෙම පද්ධතිය නිම කර භාර දීමට නියමිතව ඇත. |
| 3.1 | විදුලි බල සැපයුම වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම | |
| 3.2 | විදුලි පද්ධතියේ ආරක්ෂාවට ගෙන් වූ උපකරණ ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කිරීම | මෙම UPS පද්ධතිය සඳහා බැටරි 33 ක් සහ Rectifier ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පිළිවෙළින් රු.3,851,205.00+VAT ක් සහ රු.2,093,584.00+VAT මුදලක් සඳහා 2024.08.12 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව මගින් නිර්දේශ කර ඇති නමුත් මෙහි මිල ගණන් ලබා ගෙන වසර 01 කට වැඩි කාලයක් ගත වී තිබීමත්, එක් ලංසුකරුවෙකුගෙන් පමණක් මිල ගණන් ලබාගෙන |

| | | |
|---|---|---|
| | | තිබීමත් සහ මෙම UPS පද්ධතිය දිගු කාලයක් ක්‍රියාත්මක නොවන තත්වයේ පැවතීමත් හේතුවෙන් නැවත තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. |
| 3.3 | හෘද ශල්‍යාගාරය සඳහා සුදු යකඩ දොරක් සවි කිරීම | 2025.06.19 දින මෙයට අදාල ටෙන්ඩරය පිරිනමා ඇති අතර සුදු යකඩ දොර මේ වන විට සකස් කරමින් පවතී. |
| 3.4 | ගිනි ආරක්ෂණ සහ හඳුනා ගැනීමේ පද්ධතිය නැවත ස්ථාපනය කිරීම | 2025 වර්ෂයේ රෝහලට ලැබුණු රුපියල් මිලියන 500ක ප්‍රාග්ධන ප්‍රදානය වෙනත් අත්‍යවශ්‍ය ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දී ඇති නිසා, මෙම වසරේ ගිනි ආරක්ෂණ පද්ධතියට මුදල් වෙන් කිරීමට නොහැකි වී ඇති බැවින් එය 2026 වසරේ දී ඉටු කිරීමට අදහස් කර ඇති අතර 2026 වර්ෂයේ අයවැයට ඇතුළත් කර ඇත. |
| 6. වාර්ෂික වාර්තා සභාගත කිරීම | | 2023 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත 2025.08.20 දින ඉදිරිපත් කර ඇත.<br><br>2024 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සකස් කර ඇති අතර මුද්‍රණය යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර මුද්‍රණය කළ වහාම පාර්ලිමේන්තුව වෙත යොමු කටයුතු කරමි. |
| 7. විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් නොකිරීම | | 2025.05.15 දින වන විට පිළිතුරු සැපයීමට තිබූ විගණකාධිපති විගණන විමසුම් 11 සඳහා මේ වන විට පිළිතුරු සපයා රජයේ විගණන අංශය වෙත යවා ඇත.<br>මේ සම්බන්ධව විශේෂ අධීක්ෂණයකින් යුතුව කටයුතු කරන අතර ඉදිරියේදී මෙවැනි ප්‍රමාද වීම් වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් නිළධාරීන් වෙත ලබා දී ඇත. |
| 8. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම<br><br>I. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා 2022 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වූයේද යන්න සොයා බලා එම තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා 2022,2023 සහ 2024 වර්ෂවල ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වූ වාර ගණන පහතින් ඉදිරිපත් කරමි. |

| වර්ෂය | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනාරාල්වරයාගේසහභාගිත්වය |
|---|---|
| 2022 | සහභාගි වී නැත |
| 2023 | 03 |
| 2024 | 07 |

<table>
<tr>
<td>II. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට අධ්‍යක්ෂ මණ්ඩලයෙ සියලු සාමාජිකයන්ට සහභාගී විය හැකි වන ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම.</td>
<td>මින් පෙර සාම්ප්‍රදායිකව පැවතගෙන ආ ආකාරයට (As a tradition) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සෑම මසකම අවසාන සතියේ බ්‍රහස්පතින්දා දින පැවැත්වීමට කටයුතු කරන ලදී. නමුත් 2025.05.15 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීම අවම මට්ටමක පැවතීම පිලිබඳව සිදුකල විමසුමේදී එතුමා විසින් දන්වා සිටින ලද්දේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා නියම කරන දිනය (සෑම මසකම අවසාන සතියේ බ්‍රහස්පතින්දා දින) ඔහුගේ රාජකාරි කාර්යබහුල දිනයක් වන බැවින් ඒ සඳහා සහභාගී වීමට අපහසු බවත් හැකි අවස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වන බවත්ය. ඒ අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි දිනයක් අනෙක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේද එකගත්වය මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම සඳහා යොදා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී.<br><br>ඒ අනුව මැයි මසට අදාලව පැවති 494 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහාත් ජුනි මස පැවැත්වීමට නියමිත 495 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහාත් දින යොදා ගනු ලැබුවේද සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත විද්‍යුත් තැපැල් පණිවිඩ මගින් විමසා සියළු දෙනාගේම එකඟතාවය මතය. ඒ අනුව සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ එකඟතාවය මත ප.ව. 4.00 ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.<br>ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී විය හැක්කේ සෑම මසකම අවසාන සතියේ කිනම් දිනයේද යන්න අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙතින් ලබා ගෙන ඒ අනුව උපරිම සහභාගීත්වය සහතික වන ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.<br><br>එසේම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සෑම මසකම අදාල දින ප.ව. 4.00 ට පැවැත්වීමට කටයුතු සංවිධානය කරනු ලබන අතර සභාපතිතුමා හෝ කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ විශේෂ දැනුම්දීමක් මත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබන වේලාව වෙනස් කිරීමට සිදුවන අවස්ථාවකදී ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව ඒ සඳහා කටයුතු සංවිධානය කරනු ලැබේ.</td>
</tr>
<tr>
<td>III. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්වය පිළිබඳ නිවැරදි වාර්තා තබා ගැනීම.</td>
<td>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වන සභාපතිතුමා ඇතුළු සෑම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේම පැමිණීම තහවුරු කර ගැනීම සඳහා අත්සන් ලේඛනයක් පවතින අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වෙන දිනයේදී ඒ සඳහා සහභාගී වූ සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගෙන් අත්සන් ලබා ගැනීම සිදුකරනු ලැබේ.<br><br>ඇතැම් අවස්ථාවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සහභාගී වන අවස්ථාවලදී සහභාගීත්වය තහවුරු කිරීම සඳහා අත්සන් ලේඛනයේ Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වූ බව සටහන් කර, අත්සන අදාල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ නම ඉදිරියෙන් සටහන් කරනු ලැබේ.</td>
</tr>
</table>

| | |
|---|---|
| | එසේම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් වන දීමනාව ලබා දීමේදී ගිණුම් අංශය විසින් චෙක්පත් අංක සහිතව ලබාදෙනු ලබන අත්සන් ලේඛනයේ අත්සන් ලබා ගැනීම සිදුකෙරේ. |
| IV. අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අත්සන් කිරීමේදී අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කල කරුණු හා නිවැරදිව සත්‍ය තොරතුරු රැස්වීම් වාර්තාවේ ඇතුළත් වන්නේද යන්න පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව අත්සන් කිරීමට වගබලා ගැනීම. | 2025.05.15 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නිර්දේශ සම්බන්ධයෙන් දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ව දැනුවත් කර ඇත. |
| 10. කළමනා කරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා බඳවා ගැනීම | |
| I. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු සියලු නිලධාරීන්ට විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ගනු ලැබූ විනය ක්‍රියා මාර්ග පිළිබඳව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම. | මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ අංක MH/FS/PI/22/2025/A-168/323 යටතේ මූලික විමර්ශනයක් ක්‍රියාත්මක වේ. |
| II. මූලික පරීක්ෂණ මණ්ඩල, විධිමත් විනය පරීක්ෂණ මණ්ඩල සහ මුදල් රෙගුලාසි 104 (1) යටතේ පරීක්ෂණ සිදු කිරීමට පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී වගකීම් සහගත දැනුම පළපුරුද්ද ඇති නිලධාරීන් පත් කිරීම සහ පරීක්ෂණ වාර්තා අනුව වගකිවයුතු නිලධාරීන්ට ලබා දී ඇති දඬුවම සහ සිදු කර ඇති වරද පිළිබඳව සලකා බැලීම. | එසේම ඉදිරි මූලික පරීක්ෂණ මණ්ඩල, විධිමත් විනය පරීක්ෂණ මණ්ඩල සහ මුදල් රෙගුලාසි 104 (1) යටතේ පරීක්ෂණ සිදු කිරීමට පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී වගකීම් සහගත දැනුම පළපුරුද්ද ඇති නිලධාරීන් පත් කිරීමට සහ පරීක්ෂණ වාර්තා අනුව වගකිවයුතු නිලධාරීන්ට ලබා දී ඇති දඬුවම සහ සිදු කර ඇති වරද පිළිබඳව සලකා බලන ලෙස අදාල අංශ දැණුවත් කර ඇත. |
| III. මේ සම්බන්ධව සකස් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කළේ කවුරුන්ද? මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුළත් කරුණු පිළිබඳව සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් එම රැස්වීමේ දී සාකච්ඡා කළ කරුණු සහ මෙහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් පරස්පරතා, එකඟවිය නොහැකි කරුණු සම්බන්ධයෙන් සලකා බලා මෙම ලේඛනය සකස් කළේ කවුරුන් විසින් | ලබා දී ඇති නිර්දේශ අනුව සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් මේ වන විට ක්‍රියාත්මක වන බැවින් මෙම කරුණද එහිදී සැලකිල්ලට භාජනය වන බැවින් විමර්ෂණය අවසානයේ මේ සම්බන්ධව පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

| | |
|---|---|
| ද, අන්තර්ගත කළ කරුණු වල සත්‍ය අසත්‍යතාව සහ ලේඛනය සත්‍ය අසත්‍යතාවය පිළිබඳ කරුණු සොයා බලා ඒ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම. | |
| 11. Laundry Supervisor තනතුර | 2025.04.29 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 493:07.9 පරිදි තවදුරටත් ලොන්ඩ්‍රි අධීක්ෂක ධුරයේ අවශ්‍යතාවයක් රෝහලට නොමැති බැවින් ඔහුගේ සේවය වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කිරීමටත් අධිකරණයේ උපදෙස් පරිදි හිඟ වැටුප් ගෙවීමටත් තීරණය වූ අතර මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කටයුතු කර ඇත.<br><br>**(ඇමුණුම අංක 01)** |
| 13. දීමනා ගෙවීම්වල අක්‍රමිකතා සහ බඳවා ගැනීම් පරිපාටි | |
| I. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ මූල්‍ය පාලනයේ අක්‍රමවත් බව පරිපාලන දුර්වලතා සහ රෝහලේ උන්නතියට හේතු නොවන සියලුම තත්ත්ව පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම. | මේ සඳහා අංක MH/FS/PI/30/2025/A-166/321 යටතේ මූලික විමර්ශනයක් ක්‍රියාත්මක වේ. |
| II. ශ්‍රී ජයවර්ධනපුර මහා රෝගාශාලා මණ්ඩලයේ අදාළ සියලුම තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටි තිබේද යන්න පරීක්ෂා කර එසේ නොමැති තනතුරු සඳහා කළමනාකරණසේවා දෙපාර්තමේන්තුවට බඳවා ගැනීම් පරිපාටි සකස් කර ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම. | සියලු තනතුරු සඳහා අදාල බඳවා ගැනීම් පරිපාටි සකස් කර සෞඛ්‍ය අමාත්‍යාංශ නිර්දේශ සහිතව 2025.09.13 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |
| III. සියලුම අනීතික ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම. | ලබා දී ඇති නිර්දේශ අනුව අංක MH/FS/PI/30/2025/ A -166/321 යටතේ මූලික විමර්ශනයක් මේ වන විට ක්‍රියාත්මක වේ. |
| IV. මෙම ආයතනයේ සේවකයන්ගේ පත්වීම් ලබා දීම, වැටුප් ගෙවීම නිසි අයුරින් අනුයුක්ත කිරීම් යන සියලුම ක්‍රියාවලිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම. | • 07/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවාගත් නිළධාරීන් සඳහා වැටුප් පරිවර්තනය කර වැටුප් ගෙවනු ලැබේ. ඊට අමතරව අතිකාල දීමනා ගෙවීමේ දී එම 07/2025 චක්‍රලේඛයේ වැටුප් පරිමාණයන් පදනම් කරගෙන ගෙවනු ලබයි. වෛද්‍ය, හෙද, පරිපූරක, හා අතුරු වෛද්‍ය කාර්යය මණ්ඩලයේ අමතර රාජකාරි දීමනා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට අදාල වන රේටයන් ලබා දෙන ලෙසට ඉල්ලා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපි ඉදිරිපත් කර තිබූ අතර ඒ අනුව සෞඛ්‍ය ලේකම් වෙත යොමුකරන ලද කළමනාකරණ |
| V. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවා ගත් තනතුරු | |

| | |
|---|---|
| සම්බන්ධයෙන් විධිමත් නිවැරදි තීරණයක් කඩිනමින් ගැනීම. | සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනලාර්ගේ අංක DMS/1758/Jaya.Hos/2023 Vol.I හා 2025.07.19 ලිපියට අනුකූලව වෛද්‍ය, හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය කාර්යය මණ්ඩලයේ අමතර රාජකාරි දීමනා ගෙවීමට කටයුතු කරමින් පවතී. |
| VI. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සේවකයින්ට නිත්‍යානුකූලව හිමිකම් නොලබන දීමනා ගෙවා ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා ඒවා නැවත අයකර ගැනීමට කටයුතු කිරීම. | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි හිටපු නිලධාරියා වෙත ගෙවන ලද අනීතික ගෙවීම් සම්බන්ධයෙන් ඔහුගෙන් අය කර ගත යුතු වන රු.2,058,228/- මුදල ඔහුගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා රාගම, උතුරු කොළඹ ශික්ෂණ රෝහලෙහි අධ්‍යක්ෂ වෙත මාගේ සමාංක SJ/EB/PF/11096/2021 සහ 2025.07.02 දාතම ලිපිය මඟින් දන්වා යවා ඇත.<br>ඒ අනුව විධිමත් අනුමැතියකින් තොරව ගෙවා ඇති මෙම මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන ලෙස උතුරු කොළඹ ශික්ෂණ රෝහලෙහි අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දී ඇත.<br><br>**(ඇමුණුම අංක 02)** |
| VII. ජයවර්ධනපුර මහා රෝග්‍යශාලා මණ්ඩලයේ වැටුප් ගෙවීමේදී අනුගමනය කරනු ලබන ආකෘති වල විෂමතා ඉවත් කර සමස්ථ කාර්ය මණ්ඩලයට සමාන ආකෘතියක් යොදාගැනීම. | 07/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවාගත් නිළධාරීන් සඳහා වැටුප් පරිවර්තනය කර වැටුප් ගෙවනු ලැබේ. ඊට අමතරව අතිකාල දීමනා ගෙවීමේ දී එම 07/2025 චක්‍රලේඛයේ වැටුප් පරිමාණයන් පදනම් කරගෙන ගෙවනු ලබයි.<br>වෛද්‍ය, හෙද, පරිපූරක, හා අතුරු වෛද්‍ය කාර්යය මණ්ඩලයේ අමතර රාජකාරි දීමනා සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට අදාල වන රේටයන් ලබා දෙන ලෙසට ඉල්ලා සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් මගින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කන ලදී. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1758/Jaya.Hos/2023 Vol.I හා 2025.07.19 ලිපියට අනුකූලව වෛද්‍ය, හෙද, පරිපූරක හා අතුරු වෛද්‍ය කාර්යය මණ්ඩලයේ අමතර රාජකාරි දීමනා ගෙවීමට කටයුතු කරමින් පවතී. |
| VIII. සේවකයන්ගෙන් අය කළ යුතු අයකිරීම් අය නොකිරීම් සම්බන්ධයෙන් සොයා බලා ඒවා අයකර ගැනීමට කටයුතු කිරීම. | සේවකයන්ගෙන් අය කළ යුතු අයකිරීම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. ඒ අනුව අදාල අයවීම් සම්බන්ධ ප්‍රගතිය කාර්තුමය වශයෙන් යොමු කරන ලෙස ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ සභාපති වෙත උපදෙස් ලබා දී ඇත.<br><br>**(ඇමුණුම අංක 03)** |
| 16. රෝහලේ අනාගත කළමනාකරණ ආකෘතිය | රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව "ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙහි කළමනාකරණ ආකෘතිය අසාර්ථක බව තහවුරු වී ඇති බවත්, ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල යන රෝහල් දෙකෙහිම ධාරිතාවය, සේවාවන්හි තත්ත්වය, කළමනාකාරීත්වය සහ අනාගත සැළසුම් පිළිබඳව ගැඹුරින් අධ්‍යනය කර මෙම රෝහල් දෙකම එක් පරිපාලන යාන්ත්‍රණයක් යටතේ හෝ |

| | |
|---|---|
| | පවතින සම්පත් ප්‍රශස්තව උපයෝජනය කාල හැකි සුදුසු ව්‍යාපාරික ආකෘතියක් යටතේ ගුණාත්මක සේවාවක් සලසන තත්ත්වයට පත් කිරීම" යනුවෙන් නිර්දේශ කර ඇති බැවින් මේ පිළිබඳව අදාළ කටයුතු සිදු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිලධාරීන් 06 දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් පත්කර ඇත. එම කමිටුවෙහි තීරණය අනුව අවසන් වාර්තාව ලබා දීමට පෙර ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල මඟින් සපයන සේවාවන් වල පිරිවැය ගණනය කිරීම සහ ඒ අනුව මෙම රෝහල් දෙකෙහිම සේවාවන්හි පිරිවැය ගණනය කර වාර්තාවක් ලබාදීම සඳහා උක්ත කමිටුවේ සාමාජික වන කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික අධ්‍යන අංශයේ මහාචාර්යවරියක් වෙත භාර දී ඇත. එම වාර්තා ලැබීමෙන් පසුව මේ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. |
| 19. අධ්‍යක්ෂ මණ්ඩල සඳහා විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් (Electronic Document Management System) සැකසීම | |
| I. විධිමත් විනය පරීක්ෂණ වාර්තාව කාරක සභාවට යොමු කිරීම. | ඇමුණුම 04 මඟින් යොමු කර ඇත. |
| II. විධිමත් විනය පරීක්ෂණ කමිටුව පිළිබඳ සොයා බලා ලබා දී ඇති දඬුවම ප්‍රමාණවත්ද යන්න නැවත සලකා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීම. | විධිමත් විනය පරීක්ෂණ කමිටුව පිළිබඳ සොයා බලා ලබා දී ඇති දඬුවම ප්‍රමාණවත්ද යන්න නැවත සලකා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීම යන්න සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ ඇමුණුම 05 මඟින් යොමු කරමි. |
| III. මූලික පරීක්ෂණ මණ්ඩල, විධිමත් විනය පරීක්ෂණ මණ්ඩල සහ මුදල් රෙගුලාසි 104 (1) යටතේ පරීක්ෂණ සිදු කිරීමට පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී වගකීම් සහගත දැනුම පළපුරුද්ද ඇති නිලධාරීන් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ පරීක්ෂණ වාර්තා අනුව වගකිව යුතු නිලධාරීන්ට ලබා දී ඇති දඬුවම සහ සිදු කර ඇති වරද පිළිබඳව සලකා බැලීම. | මූලික පරීක්ෂණ මණ්ඩල, විධිමත් විනය පරීක්ෂණ මණ්ඩල සහ මුදල් රෙගුලාසි 104 (1) යටතේ පරීක්ෂණ සිදු කිරීමට පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී වගකීම් සහගත දැනුම හා පළපුරුද්ද ඇති නිලධාරීන් පත් කිරීම සිදු කර ඇති අතර අදාල පරීක්ෂණ වාර්තා අනුව සිදු කර ඇති වරද පිළිබඳව සලකා බලා වගකිව යුතු නිලධාරීන්ට නියම කෙරෙන දඬුවම් ලබා දීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| 20. ස්නායු ශලා ඒකකය සඳහා රුපියල් මිලියන 4,12 වැය කර මිලදී ගෙන තිබුණු ශල්‍ය ද්‍රව්‍ය වලින් සියයට 80 ක් භාවිතයෙන් තොරව කල් ඉකුත් වීම<br>ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් කාරක සභාව වෙත යොමු කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තාව අනුව රජයට සිදු වී ඇති පාඩුව වැළැක්වීමට ක්‍රියාමාර්ග නොගැනීම | සෞඛ්‍ය අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද පරීක්ෂණ වලට අදාල අංක FIB/06/2018 හා 2018.05.19 දිනැති සහ අංක ETR/Inq.SJP/012024 හා 2025.03.... දින රහිත වාර්තාවන්හි පරස්පරතාවය සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා අංක MH/FS/PI/07/2025/A-322/632 යටතේ මූලික විමර්ශනයක් ක්‍රියාත්මක වේ. |

<table>
<tr><td>සම්බන්ධයෙන් රෝහලේ පාලනාධිකාරිය ඇතුළු ඊට සම්බන්ධ සියලුම නිලධාරීන් සාමූහිකව වගකිවයුතු බව දක්වා තිබියදී මු.රෙ.104 (1) අනුව කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව රජයට සිදු වී ඇති පාඩුව සම්බන්ධයෙන් සෘජුවම නිලධාරීන් වගකිවයුතු නොවන බව ද දක්වා තිබීම යන්න තුළින් ඇති වන පරස්පරතාවය පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කිරීම.</td><td></td></tr>
<tr><td>21. ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ ගෙවන වාට්ටු කාමර 04 ක් විශේෂ කාමර (Family room) ලෙස නවීකරණය කිරීම ඇතුළු කාමර 50 ක් නවීකරණය</td><td rowspan="2">ඇමුණුම 06 මගින් ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td>1. රූපවාහිනි යන්ත්‍ර මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයට හා තාක්ෂණික ඇගයීමට අදාළ සියලු වාර්තා කාරක සභාවට ඉදිරිපත් කිරීම.</td></tr>
<tr><td>II. සියලුම රූපවාහිනි යන්ත්‍ර සවිකර භාවිතයට ගැනීම සහ ඒ පිළිබඳව ස්ථානීයපරීක්ෂණ සිදු කර කාරක සභාවට සහ විගණකාධිපතිට වාර්තාවක් සතියක් තුළ ඉදිරිපත්කිරීම.</td><td><u>LG UHD 43" රූපවාහිනී යන්ත්‍ර 04</u><br><br>LG UHD 43" වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර 04 ක් රෝහලට ලැබී තිබූ අතර ඒ පිළිබඳව 2025.08.26 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.<br><br>
<table>
<tr><th>ස්ථානය</th><th>සංඛ්‍යාව</th><th>වර්තමාන තත්වය</th></tr>
<tr><td>වාට්ටු අංක 04</td><td>02</td><td>සවි කර භාවිතයේ පවතී.</td></tr>
<tr><td rowspan="2">වාට්ටු අංක 05</td><td rowspan="2">02</td><td>1 ක් සවි කර භාවිතයේ පවතී.</td></tr>
<tr><td>කාමර 508 හි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින බැවින් එය නිම වූ පසු මෙම රූපවාහිනී යන්ත්‍රය සවි කර භාවිතයට ගැනේ.</td></tr>
</table></td></tr>
</table>

<u>Singer UHD 43" රූපවාහිනී යන්ත්‍ර 25</u>

Singer UHD 43" වර්ගයේ රූපවාහිනී යන්ත්‍ර 25 ක් රෝහලට ලැබී තිබූ අතර ඉන් රූපවාහිනී යන්ත්‍ර 10 ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත (ඇමුණුම් අංක 07) 2025.05.24 දින සැපයුම්කරුට ආපසු යවා ඇත.

ඉතිරි රූපවාහිනී යන්ත්‍ර 15 පිළිබඳව 2025.08.26 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| ස්ථානය | සංඛ්‍යාව | වර්තමාන තත්වය |
|---|---|---|
| වාට්ටු අංක 03 | 09 | සවි කර භාවිතයේ පවතී |
| වාට්ටු අංක 04 | 04 | සවි කර භාවිතයේ පවතී |
| වාට්ටු අංක 05 | 02 | සවි කර භාවිතයේ පවතී |

සැපයුම්කරුට ආපසු යවා ඇති රූපවාහිනී යන්ත්‍ර 10 ට අදාල වටිනාකම වන රු. 1,054,439.98 ක මුදල එම ආයතනයට ගෙවිය යුතු තිබූ මුදලින් අඩු කිරීමට පියවර ගෙන ඇත.
(ඇමුණුම අංක 08)

22. 2024 වර්ෂයේ මැතිවරණ කාලසීමාව තුළ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා නියමිත බඳවා ගැනීමේ ක්‍රමවේදයෙන් බැහැරව බඳවා ගැනීම් සිදු කිරීම

මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු සියලු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම සහ ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් මාස 01 ක් තුළ කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.

මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ අංක MH/FS/PI/22/2025/A-168/323 යටතේ මූලික විමර්ශනයක් ක්‍රියාත්මක වේ.

| | |
|---|---|
| 24. මෙරපනම් (Meropenem) ඖෂධය දේශීයව මිලදී ගැනීම සම්බන්ධ ගැටළු (Issues regarding Local Purchase of Meropenem Drug) | මෙම සම්පූර්ණ ක්‍රියාවලිය විමර්ශනය කිරීම සඳහා කමිටු සාමාජිකයින් 03 කින් යුත් විමර්ශනය කමිටුවක් මේ වන විට පත් කර ඇත.<br>1. වෛද්‍ය ධම්මික අලහප්පෙරුම මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැ.බ)<br>2. ලලිත් බාලසූරිය මහතා - ප්‍රධාන ගණකාධිකාරී (වැ.බ)<br>3. රුවන්තිකා ගුණවර්ධන මිය - (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් හා නීති නිළධාරී)<br>එම විමර්ශන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබුණු පසුව ඒ සම්බන්ධ විනය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ. |
| I. සායනික ඇගයීමක් සිදු කර මෙම ඖෂධ මිලදී ගැනීම.<br>II. මෙම ක්‍රියා පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා මෙවැනි තත්ත්ව නිවැරදි කිරීමට කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | |
| 25. ඖෂධ එන්නතක් අසාත්මක වීම සම්බන්ධව පළවූ පුවත්පත් වාර්තාව | 2025.05.22 දින පැවති පැමිණිලි කළමනාකරණ කමිටුව මගින් පැමිණිළි 08 ක් සාකච්ඡා කරන ලදී. මෙහි දී පැමිණිළි වලට අදාළ නිළධාරින්ගෙන් නිරීක්ෂණ වාර්තා කැඳවීමට කටයුතු කර ඇති අතර 2025.06.15 දින වන විට අදාල පිළිතුරු ලිපි 04 ක් ලැබී ඇති අතර එළඹෙන කමිටු රැස්වීමේ දී ඊට අදාළ නිර්දේශ ලබා දීමට කටයුතු කරනු ලැබේ. කාරක සභාව ලබාදී ඇති නිර්දේශ ප්‍රකාරව මෙම පැමිණිළි විමර්ශනය වඩාත් කඩිනමින් ඉටු කිරීමට පියවර ගන්නා බව වැඩි දුරටත් දන්වා සිටිමි. |
| I. පැමිණිලි විමර්ශන කමිටුවේ කටයුතු කඩිනම් කිරීම සහ මහජන පැමිණිලි ලද වහාම අදාළ පරීක්ෂණ කටයුතු ආරම්භ කළ බව සහ පරීක්ෂණය අවසන් කර තීරණය ලබා දෙන දිනය පිළිබඳ ලිඛිතව ඔවුන්ව දැනුවත් කිරීම. | |
| II. රෝහලේ කීර්තිනාමයට හානියක් නොවන ආකාරයට මහජන පැමිණිලි කළමනාකරණයට අවශ්‍ය කටයුතු සිදු කර නිරන්තර අධීක්ෂණයකට ලක් කිරීම සහ ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම. | අවශ්‍ය අයුරින් වාර්තා තබා ගැනීම දැනටමත් කර ඇති අතර ඒ පිළිබඳව ක්‍රියා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද කළමනාකරණ සහකාරවරියකගේ සහාය ලබා ගැනීමටද කටයුතු කර ඇත. එතුළින් රෝහල් කීර්තිනාමය රැකෙන ආකාරයට ලබාදී ඇති නිර්දේශ අනුව කටයුතු සිදුකිරීමට පියවර ගන්නා බව වැඩිදුරටත් දන්වා සිටිමි. |
| III. රෝහලේ කීර්තිනාමයට අහිතකර මාධ්‍ය වාර්තා කිරීම් නිවැරදි කිරීමට කටයුතු කිරීම. | ඒ.ඩී.ගාමිණී තිලකසිරි මහතා විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධව රෝහල් පැමිණිලි කළමනාකරණ කමිටුව විසින් සකසන ලද වාර්තාව 2025.08.07 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට යොමු කර ඇති අතර ඔහුට මුදල් ආපසු ගෙවීම සිදු කළ නොහැකි බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත.ඇමුණුම අංක 09 මගින් අදාළ කමිටු වාර්තාව යොමුකර ඇත.<br>2024.11.07 වන දින සිට මේ දක්වා පැමිණිලි කළමනාකරණ කමිටුව වෙත පැමිණිලි 31 ලැබී ඇත. ඉන් පැමිණිලි 04 ඉතා මෑතක ලැබුනු පැමිණිලි වන අතර එම පැමිණිලිද කමිටුවට යොමුකර ඉක්මනින් කමිටු නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 26. වෘත්තිය ගාස්තු සහ රෝහල් අදායම (Professional Fees and Hospital Revenue) | වෘත්තිය ගාස්තු වලින් 0.15% ක් රෝහල් සේවා ගාස්තු ලෙස අයකර ගැනි ගැනීම සම්බන්ධව 2024.04.29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලද අතර මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව අංක 493:05.2 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එම අගය එලෙසම තැබීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ගෙන ඇත. |

| | |
|---|---|
| මෙම සියලු ගෙවීම් සඳහා නිශ්චිත විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීම සහ එම ක්‍රමවේද පිළිබඳව මාස 02 ක් තුළ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත්කිරීම. | 493:05.2 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය, වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.04.29 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයකි. (ඇමුණුම අංක 10) |
| 27. රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදීම හා ඒ සඳහා වෘත්තීය ගාස්තු අය කිරීම<br><br>මෙම සියලු ගෙවීම් සඳහා නිශ්චිත විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීම සහ එම ක්‍රමවේද පිළිබඳව මාස 02 ක් තුළ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත්කිරීම. | වෘත්තීය ගාස්තු මගින් අදාළ සේවා ගාස්තුව කළමනාකරණ වියදමක් ලෙස අය කර ගත්තද මේ සඳහා වැය වන අනෙකුත් වියදම් රෝගියාගෙන් අය කරගන්නා අතර එයට 30% ලාභාන්තිකයක් රෝහල අය කර ගනී.(ඇමුණුම් අංක 11)<br>බාහිරව පැමිණෙන විශේෂඥ වෛද්‍යවරුන්ට අදාල වන රෝගීන්ගේ වගකීම රෝහල තුල සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය යටතේ විය යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇති අතර එයට අනුව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.<br>(ඇමුණුම අංක 12) |
| 29. රෝගීන්ගේ රොහල් ගාස්තු බිල්පත් ගෙවීම්වලින් නිදහස් කර තිබීම<br><br>රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් ගෙවීම් වලින් නිදහස් කර තිබීම පිළිබඳව අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතින පරීක්ෂණ අවසන් වූ පසු එහි වාර්තාව කඩිනමින් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම. | රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් ගෙවීම් වලින් නිදහස් කර තිබීම පිළිබඳව අංක MH/FS/PI/22/2024/A-46/84 යටතේ මූලික විමර්ශනයක් ක්‍රියාත්මක කෙරේ. |
| 30. රෝහල් ගාස්තු බිල්පත් නොගෙවා රෝහලෙන් බැහැරවූ රෝගීන්ගේ අය විය යුතු මුදල් අය කිරීම<br><br>මේ පිළිබඳව සොයා බලා අදාළ අයකිරීම් කර ගැනීමට කඩිනමින් කටයුතු කිරීම සහ ඒ පිළිබඳ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවක් කිරීම. | කොවිඩ් ශේෂය තුල පවතින රෝහල් කාර්යය මණ්ඩල සේවකයින්ගෙන් අය විය යුතු ශේෂ 2025 ජූලි මස වැටුපෙන් අය කර ගෙන ඇත. (ඇමුණුම අංක 13)<br><br>කොවිඩ් ශේෂය වන රු. මිලියන 23 ඇතුලත ඇති හිඟ ණයගැති ශේෂය ( Outstanding Debtors) යටතේ ඇති රු. මිලියන 05 ක ණයගැති ශේෂවල ඇතුලත් රු.674,134.60 ක් රෝහල් සේවකයන්ගෙන් අය විය යුතු වටිනාකම ඔවුන්ගේ වැටුපෙන් අය කර ගෙන මේ වන විට පද්ධතියෙන් ඉවත් කර ඇත. (ඇමුණුම අංක 14)<br><br>විශ්‍රාම ගිය නිළධාරීන්ගෙන් අය විය යුතු නිළධාරීන් වෙත ලිපි මගින් දැනුවත් කර ඇති අතර එම මුදල් ගෙවන තුරු ඔවුන්ගේ නිදහස් වෛද්‍ය ප්‍රතිකාර දීමනාව නතර කර ඇත. අනෙකුත් ශේෂයන් සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තීරණය කිරීමට ඇඳ ඉහපත් වාර්තා 86 ක් වෛද්‍ය වාර්තා අංශයෙන් ඉල්ලා ඇති අතර ඉන් ඇඳ ඉහපත් වාර්තා 29 ක් මේ වන විට ලැබී ඇති අතර ඒවා පරීක්ෂා කර වාර්තාවක් සකස් කර ඇත. ඉතිරි ඇඳ ඉහපත් ලිපිගොනු ලැබුණු පසුව පරීක්ෂා කර ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |

| | |
|---|---|
| 31. නොමිලේ ප්‍රතිකාර ලබා දීමේ ප්‍රතිපත්තිය (Free Treatment Policy)<br>මෙම සේවා ලබා දීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කර ලේඛනගත කිරීමට කඩිනමින් අවශ්‍ය කටයුතු කිරීම සහ ඒ පිළිබඳ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත් කිරීම. | මේ සම්බන්ධව රජයේ ප්‍රතිපත්ති සමග කටයුතු කිරීමට තීරණය කර ඇත. |

සටහන - මෙහි සඳහන් සියළු ඇමුණුම් 2025.05.15 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දැණුම් දීම සඳහා යොමු කරනු ලැබූ පිලිතුර සමඟ පොදු ව්‍යාපාර කාරක සභා ලේකම් වෙත හා විගණකාධිපති වෙත යොමුකර ඇත.

.............................................

වෛද්‍ය නලින්ද ජයතිස්ස ,

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය